Lesson 61 **Hostel Life**

නේවාසිකාගාර ජීවිතය

"So, where are you coming from?" Saman asked.

“සෝ , වෙයා ආ යූ කමින් ෆ්‍රොම් ?” සමන් ආස්ක්ඩ්

“ඉතින් , ඔයා කොහේ ඉදලද එන්නේ ?” සමන් ඇසුවේය

"From Medawala" I replied

“ෆ්‍රොම් මැදවල “. අයි රිප්ලයිඩ්

“මැදවල ඉදන් “. මම පිළිතුරු දුනිමි

"That’s a long way from here. Do you travel from there daily?"

“දැට්ස් අ ලෝං වේ ෆ්‍රොම් හියර්) . ඩූ යූ ට්‍රැවල් ෆ්‍රොම් දෙයා ඩේලි ?’

“මෙහෙ ඉදන් සෑහෙන්න දුර . ඔයා දිනපතා එහෙ ඉදන් එනවද ? “

"No, I’m staying with my aunt in Horawala."

“නෝ, අයිම් ස්ටේයිං විත් මයි ආන්ට් ඉන් හොරවල “

“නෑ , මම නැවතිලා ඉන්නේ හොරවල මගේ නැන්දලගේ ගෙදර “ (stay -නතරවෙලා ඉන්නවා )

"Horawala is also quite far from here. Buses are rare on that route and not even punctual."

“හොරවල ඉස් ඕල්සෝ ක්වයිට් ෆා ෆ්‍රොම් හියර්). බසස් ආ රෙයා ඔන් දැට් රූට් ඇන්ඩ් නොට් ඊවන් පංක්චුවල් “

“හොරවලත් මෙහෙ ඉදන් සෑහෙන්න දුරයි. බස් අඩුයි ඒ පාරේ , වෙලාවට යන්නෙත් නැහැ” (punctual - වෙලාවට කරන හෝ කෙරෙන )

"Yes, I’ve heard the buses aren’t regular and are often late, but today I could catch a bus on time."

“යස් , අයිව් හ(ර්)ඩ් ද බසස් ආන්ට් රෙගියුල(ර් ඇන්ඩ් ආ ඕෆ්න් ලේට් බට් ටුඩේ අයි කුඩ් කැච් අ බස් ඔන් ටයිම් “

‘ඔව්. මට අහන්න ලැබුනා බස් බස් එකදිගටම නැහැ , ගොඩක් වෙලාවට පරක්කුයි කියල , ඒ වුනාට අද මට වෙලාවට බස් එකක් අල්ලගන්න පුළුවන් වුනා “ (regular - විධිමත්, අඛණ්ඩ )

"Why don't you stay at the school hostel? I am staying there . It's not a bad place at all."

"වයි ඩෝන්ට් යු ස්ටේ ඇට් ද ස්කූල් හොස්ටල් ? අයෑම් ස්ටේයිං දෙයා . ඉට්ස් නොට් අ බෑඩ් ප්ලේස් ඇට් ඕල් (ඇටෝල් )"

"ඔයා ඇයි ඉස්කෝලේ හොස්ටල් එකේ නතර වෙන්නේ නැත්තෙ ? මම නතරවෙලා ඉන්නේ හොස්ටල් එකේ . ඒක නරක තැනක් නම් නෙවෙයි කීයටවත් "

"We can do a lot of things together , study, play sports, and have adventures in the evening." He said with a grin . That quiet smile said that he had grown to love a place that he once feared.

"වී කැන් ඩූ අ ලොට් ඔෆ් (ලොටොෆ් ) තිංස් ටුගෙද(ර්) , ස්ටඩි , ප්ලේ ස්පෝට්ස් ඇන්ඩ් හෑව් ඇඩ්වෙන්ච(ර්)ස් ඉන් දි ඊව්නින්. " හී සේඩ් විත් අ ග්‍රින්. දැට් ක්වයට් ස්මයිල් සේඩ් දැට් හී හෑඩ් ග්‍රෝන් ටු ලව් අ ප්ලේස් දැට් හී වන්ස් ෆියර්ඩ්

"අපිට ගොඩක් දේවල් කරන්න පුළුවන් එකට . ඉගෙනීම් වැඩ , ක්‍රීඩා ,ඒ වගේම එක එක වීර ක්‍රියාත් කරන්න පුළුවන් හැන්දෑවට" සිනාසෙමින් ඔහු කීවේය ඒ නිහඬ සිනහව කිවේ ඔහු වරක් බියවූ තැනකට ඔහු ආසා කිරීමට පටන්ගෙන ඇති බවයි

(adventure -වීර ක්‍රියාව , උද්යෝගිමත් , බිය නොතකා කරන අවධානමක් සහිත ක්‍රියාව )

"Okay, I'll(I will) ask my aunt and my parents. Who should I speak to at school if I want to stay at the hostel?"

"ඕකේ , අයිල් ආස්ක් මයි ආන්ට් ඇන්ඩ් මයි පේරන්ට්ස් . හූ ෂුඩ් අයි(ෂුඩයි) ස්පීක් ටු ඇට් ස්කූල් ඉෆ් අයි වෝන්ට් ටු ස්ටේ ඇට් ද හොස්ටල් "

"හරි , මම අම්මගෙන් තාත්තගෙනුයි නැන්දගෙනුයි අහන්නම්. මට හොස්ටල් එකේ නවතින්න ඕන නම් මම ස්කෝලේ කාටද කතා කරන්න ඕන ? "

"First, tell our class teacher. She'll arrange the rest."

"ෆස්ට් , ටෙල් අව(ර්) ක්ලාස් ටීච(ර්) , ෂී විල් ඇරෙන්ජ් ද රෙස්ට්"

"මුලින්ම අපේ පන්ති භාර ටීච(ර්)ට කියන්න. එයා ඉතුරු ටික පිළියෙළ කරයි " (arrange - පිළියෙළ කරනවා ) (the rest - ඉතිරිය )

"Alright. By the way, where are you from?"

"ඕල්රයිට් . බයි ද වේ , වෙයා(ර්) ආ යූ ෆ්‍රොම් ?"

"හරි , ඒක නෙවෙයි , ඔයාගෙ ගම කොහෙද ? "

"I'm from Udawela. I can travel from home daily, but it takes about an hour and a half,

" අයෑම් ෆ්‍රොම් උඩවෙල. අයි කැන් ට්‍රැවල් ෆ්‍රොම් හෝම් ඩේලි, බට් ඉට් ටේක්ස් අබවුට් ඈන් අව(ර්) ඇන්ඩ් අ හාෆ් "

“මම උඩවෙල. මට දිනපතා ගෙදර ඉඳන් එන්න පුළුවන් , ඒත් ඒකට පැය එකහමාරක් විතර යනවා” (travel - ගමන් කරනවා )

“So my father decided that I should stay at the hostel. At first, I didn’t like the idea, but now I’m happy about it."

“සෝ මයි ෆාද(ර්) ඩිසයිඩඩ් දැට් අයි ෂුඩ් ස්ටේ ඇට් ද හොස්ටල්. ඇට් ෆස්ට් අයි ඩිඩ්න්ට් ලයික් දි අයිඩියා, බට් නව් අයෑම් හැපී අබවුට් ඉට්”

“ඒ නිසා මගේ තාත්තා තීරණය කළා මම හොස්ටල් එකේ නතර වෙන්න ඕන කියල . මුලදී මම ඒ අදහසට කැමති වුනේ නැහැ .නමුත් දැන් මම ඒ ගැන සතුටුයි”

After a week, I got permission from my parents to stay in the school hostel. My aunt wasn’t happy about it at all, but I convinced my parents that it would be better for my studies,and they agreed

ආෆ්ට(ර්) අ වීක්, අයි ගොට් ප(ර්)මිෂන් ෆ්‍රොම් මයි පේරන්ට්ස් ටු ස්ටේ ඉන් ද හොස්ටල් . මයි ආන්ට් වොස්න්ට් හැපී අබවුට් ඉට් ඇට් ඕල්(ඇටෝල්) , බට් අයි කන්වින්ස්ඩ් මයි පේරන්ට්ස් දැට් ඉට් වුඩ් බී බෙට(ර්) ෆෝ මයි ස්ටඩීස් , ඇන්ඩ් දේ ඇග්‍රීඩ්

සතියකට පසු , නේවාසිකාගාරයේ නතර වීමට මගේ දෙමව්පියන්ගෙන් මට අවසරය ලැබුණි . මගේ නැන්දා ඒ ගැන කිසිසේත් සතුටට පත් නොවුවාය , නමුත් එය මගේ ඉගෙනීම් වැඩ වලට වඩාත් හොඳ වේයැයි මම මගේ දෙමව්පියන්ට ඒත්තු ගැන්වූ අතර ඔවුන් ඊට එකඟ විය (permission - අවසරය )(convince - කන්වින්ස් - ඒත්තු ගන්වනවා )

There were about 25 boys in the hostel. It was clean and tidy. We had a warden and two or three assistants.

දෙයා ව(ර්) අබවුට් ට්වෙන්ටි ෆයිව් බෝයිස් ඉන් ද හොස්ටල් .
ඉට් වෝස් ක්ලීන් ඇන්ඩ් ටයිඩි . වී හෑඩ් අ වෝඩ්න් ඇන්ඩ් ටූ ඕ ත්‍රී ඇසිස්ටන්ට්ස් .

නේවාසිකාගාරයේ පිරිමි ළමුන් 25 දෙනෙකු පමණ විය . එය පිරිසිදුව සහ පිළිවෙලට තිබුණි. අපට නේවාසිකාගාර පාලකයෙකු සහ සහායකයන් දෙතුන් දෙනෙකු විය (assistant - ඇසිස්ටන්ට් - සහායකයා )

The boys lived in a large hall with beds lined up on both sides. Behind the main hall, there was a large backyard

ද බෝයිස් ලිව්ඩ් ඉන් අ ලාජ් හෝල් විත් බෙඩ්ස් ලයින්ඩ් අප් ඔන් බෝත් සයිඩ්ස් . බිහයින්ඩ් ද මේන් හෝල් ,දෙයා වෝස් අ ලාජ් බැක්යාඩ්

දෙපැත්තේම ඇඳන් පේලියට තැබූ විශාල ශාලාවක පිරිමි ළමයි විසූහ . ප්‍රධාන ශාලාව පිටුපස විශාල මිදුලක් තිබුණි (backyard - පිළිකන්න )

At the end of the backyard were the kitchen, storeroom, and a few rooms for the teachers and assistants

ඇට් දී එන්ඩ් ඔෆ් ද බැක්යාඩ් ව(ර්) ද කිචන් , ස්ටෝ රූම් ,ඇන්ඩ් අ ෆිව් රූම්ස් ෆෝ ද ටීච(ර්)ස් ඇන්ඩ් ඇසිස්ටන්ට්ස්

ඒ මිදුල කෙලවර කුස්සිය,ගබඩා කාමරය, ගුරුවරුන්ට සහ සහායකයන්ට වූ කාමර කිහිපයක් තිබුණි .

Behind those was the girls' hostel. It was also a large hall of the same size.

බිහයින්ඩ් දෝස් වෝස් ද ග(ර්)ල්ස් හොස්ටල් .ඉට් වෝස් ඕල්සෝ අ ලාජ් හෝල් ඔෆ් ද සේම් සයිස්

ඒවාට එපිටින් වූයේ ගැහැණු ළමුන්ගේ නේවාසිකාගාරයයි. එයද එම ප්‍රමාණයේම විශාල ශාලාවක් විය

The distance between the two halls was about 100 meters. We were never allowed

to go near the girls' hostel.

ද ඩිස්ටන්ස් බිට්වීන් ද ටූ හෝල්ස් වෝස් අබවුට් හන්ඩ්‍රඩ් මීට(ර්)ස් . වී ව(ර්) නෙව(ර්) අලව්ඩ් ටූ ගෝ නියර්(ර්) ද ග(ර්)ල්ස් හොස්ටල්

ශාලා දෙක අතර දුර ප්‍රමානය මීටර සියයක් පමණ විය.ගැහැණු ළමුන්ගේ නේවාසිකාගාරය අසලට යාමට අපට කිසිවිටෙක් ඉඩ නොලැබුණි (distance - දුර ) (allow - ඉඩ දෙනවා )

In the evening, the boys usually played cricket on the school grounds. The girls weren't allowed to go that far from their hostel. They played in a yard ,about 40 meters away from the boys hostel .

ඉන් දී ඊව්නින්, ද බෝයිස් යූෂුවලි ප්ලේඩ් ක්‍රිකට් ඔන් ද ස්කූල් ග්‍රවුන්ඩ්ස් . ද ග(ර්)ල්ස් ව(ර්)න්ට් අලව්ඩ් ටු ගෝ දැට් ෆා ෆ්‍රොම් දෙයා හොස්ටල්. දේ ප්ලේය්ඩ් ඉන් අ යාඩ් , අබවුට් ෆෝටි මීට(ර්)ස් අවේ ෆ්‍රොම් ද බෝයිස් හොස්ටල්

පිරිමි ළමුන් හැන්දෑවට සාමාන්‍යයෙන් පාසල් ක්‍රීඩා පිටියේ ක්‍රිකට් ක්‍රීඩා කළහ . ගෑනු ළමුන්ට ඔවුන්ගේ නේවාසිකාගාරයේ සිට එතරම් දුර යාමට අවසර ලැබුනේ නැත .ඔවුන් පිරිමි නේවාසිකාගාරයට මීටර් 40 ක් පමණ එපිටින් වූ තීරුවක සෙල්ලම් කළහ

It was a small patch about 50 meters long and 15 meters wide. During school hours,

students of the primary section used it as a playground. In the evening, it was used by the hostel girls.

ඉට් වෝස් අ ස්මෝල් පැච් අබවුට් ෆිෆ්ටි මීට(ර්)ස් ලෝං ඇන්ඩ් ෆිෆ්ටීන් මීට(ර්)ස් වයිඩ්. . ඩියුරින් ස්කූල් අව(ර්)ස් ස්ටුඩන්ට්ස් ඔෆ් ප්‍රයිමරි සෙක්ෂන් යූස්ඩ් ඉට් ඈස් අ ප්ලේ ග්‍රවුන්ඩ් , ඉන් ද ඊව්නින්, ඉට් වෝස් යූස්ඩ් බයි ද හොස්ටල් ග(ර්)ල්ස්

එය මීටර් 50 ක් පමණ දිග , මීටර් 15ක් පමණ පළල කුඩා තීරුවක් විය . පාසල් කාලය තුල බාලාංශ පන්ති වල සිසුන් එය සෙල්ලම් පිටියක් ලෙස භාවිතා කල අතර, හැන්දෑ කාලයේදී නේවාසිකාගාර යුවතියන් විසින් එය භාවිත කරන ලදී

Occasionally, we joined them for a game of volleyball or badminton. That was

the only time we spoke a few words to them.

ඔකේෂනලි , වී ජොයින්ඩ් දෙම් ෆෝ අ ගේම් ඔෆ් වොලිබෝල් ඕ බැඩ්මින්ටන්. දැට් වෝස් ද ඔන්ලි ටයිම් වී ස්පෝක් අ ෆිව් ව(ර්)ඩ්ස් ටු දෙම්

ඉඳහිට , වොලිබෝල් හෝ බැඩ්මින්ටන් ක්‍රීඩාවකට අපි ඔවුන් සමග එක් වූයෙමු . අප ඔවුන් සමග වචන කීපයක් කතා කල එකම වෙලාව එය විය (occasionally- ඉඳලා හිටලා )

Any other time when we met face to face, whether during school or after, we behaved like strangers. We never looked at each other’s faces.

එනි අද(ර්) ටයිම් වෙන් වී මෙට් ෆේස් ටු ෆේස්, වෙද(ර්) ඩියුරින් ස්කූල් ඕ ආෆ්ට(ර්) ,වී බිහේව්ඩ් ලයික් ස්ට්‍රේන්ජ(ර්)ස් .වී නෙව(ර්) ලුක්ඩ් ඇට් ඊච් අද(ර්)ස් ෆේසස්

අප මුහුණට මුහුණ හමු වූ අන් කිසිඳු අවස්තාවක, පාසල් කාලය තුල හෝ පසු , අපි අමුත්තන් මෙන් හැසිරුනෙමු.අපි කිසි දිනෙක එකිනෙකාගේ මුහුණු නොබැලුවෙමු (stranger - අමුත්තා )

Among the hostel girls, there was one from our class. We spoke a few words with her only when we joined their games. Our words were brief, shy, and half-swallowed, but they brought a quiet joy

අමං ද හොස්ටල් ග(ර්)ල්ස්, දෙයා වෝස් වන් ෆ්‍රොම් අව(ර්) ක්ලාස් . වී ස්පෝක් අ ෆිව් ව(ර්)ඩ්ස් විත් හ(ර්) ඔන්ලි වෙන් වී ජෝයින්ඩ් දෙයා ගේම්ස් . අව(ර්) ව(ර්ඩ්ස් ව(ර්) බ්‍රීෆ් , ෂයි , ඇන්ඩ් හාෆ් ස්වොලෝව්ඩ් - බට් දේ බ්‍රෝට් අ ක්වයට් ජෝයි

නේවාසිකාගාර යුවතියන් අතර අප පන්තියේ අයෙකුද විය . අප ඇය සමග වචන කිහිපයක් හෝ කතා කලේ අප ඔවුන්ගේ ක්‍රීඩාවකට සම්බන්ධ වූ විට පමණි . අපේ වචන කෙටි , ලජ්ජාශීලි සහ බාගෙට ගිලගත් ඒවා විය , නමුත් ඒවා රැගෙන ආවේ නිහඬ ප්‍රීතියකි (swallow - ස්වොලෝ - ගිලිනවා )

In the class, we never talked. We acted like we didn’t know each other

ඉන් ද ක්ලාස් ,වී නෙව(ර්) ටෝක්ඩ් . වී ඇක්ටඩ් ලයික් වී ඩිඩ්න්ට් නෝ ඊච් අද(ර් )

පන්තියේදී අපි කිසී විටෙක කතා නොකළෙමු . අපි හැසිරුනේ අපි එකිනෙකා නොදන්නාක් මෙනි

Most of the hostel girls were good-looking with golden yellow skin. We often wondered what made their skin so beautiful. After months, one guy discovered the reason: pumpkin!

මෝස්ට් ඔෆ් ද හොස්ටල් ග(ර්)ල්ස් ව(ර්) ගුඩ් ලුකිං විත් ගෝල්ඩන් යෙලෝ ස්කින් . වී ඔෆ්ටන් වොන්ඩ(ර්)ඩ් වට් මේඩ් දෙයා(ර්) ස්කින් සෝ බියුටිෆුල් . ආෆ්ට(ර්) මන්ත්ස් , වන් ගයි ඩිස්කව(ර්)ඩ් ද රීසන් : පම්කින් !

නේවාසිකාගාර යුවතියන්ගෙන් බොහෝ දෙනෙක් රත්තරන් කහ පැහැති සමින් යුත් මනා පෙනුමැති අය වූහ . ඔවුන්ගේ සම එතරම් ලස්සන් වූයේ කුමක් නිසා දැයි අපි නිතර කල්පනා කළෙමු. මාස ගණනකට පසු එක් හාදයෙක් හේතුව සොයා ගත්තේය . ඒ වට්ටක්කාය !

We often had pumpkin in our meals because it was a cheap vegetable . Then came the question: why don't the boys get such beautiful skin from eating pumpkins? Nobody had an answer for that. It became a joke among us, but it always kept us wondering

වී ඔෆ්ටන් හෑඩ් පම්කින් ඉන් අව(ර්) මීල්ස් බිකෝස් ඉට් වෝස් අ චීප් වෙජිටබල් . දෙන් කේම් ද ක්වෙස්චන්: වයි ඩෝන්ට් ද බෝයිස් ගෙට් සච් බියුටිෆුල් ස්කින් ෆ්‍රොම් ඊටින් පම්කින්ස් ? නෝබොඩි හෑඩ් අන් ආන්ස(ර්) ෆෝ දැට් . ඉට් බිකේම් අ ජෝක් අමං අස් , බට් ඉට් ඕල්වේස් කෙප්ට් අස් වොන්ඩරිං

එය මිල අඩු එළවළුවක් වූ නිසා අපට බොහෝවිට අපගේ කෑමවේල් වලට වට්ටක්කා ලැබුණි .ඊළගට පැමිණි ප්‍රශ්නය වූයේ වට්ටක්කා කෑමෙන් පිරිමි ළමුන්ට එවනි ලස්සන සමක් නොලැබෙන්නේ මන්ද යන්නයි . කිසිවෙකු හට ඒ සදහා පිළිතුරු තිබුනේ නැත. එය අප අතර විහිළුවක් බවට පත් විය , එහෙත් එය නිතරම මෙන් අපව විමතියට පත් කළේය

The wardens of both the boys' and girls' hostels were young and friendly. An assistant once told us that the previous wardens were very strict and never allowed the girls and boys to play together or talk to each other. But in our time, we had just enough freedom to make friendly contact without crossing those invisible lines.

ද වෝ(ර්)ඩ්න්ස් ඔෆ් බෝත් ද බෝයිස් ඇන්ඩ් ග(ර්)ල්ස් හොස්ටල්ස් ව(ර්) යං ඇන්ඩ් ෆ්‍රෙන්ඩ්ලි. ඇන් ඇසිස්ටන්ට් වන්ස් ටෝල්ඩ් අස් දැට් ද ප්‍රිවියස් වෝ(ර්)ඩ්න්ස් ව(ර්) වෙරි ස්ට්‍රික්ට් ඇන්ඩ් නෙව(ර්) අලව්ඩ් ද ග(ර්)ල්ස් ඇන්ඩ් බෝයිස් ටු ප්ලේ ටුගෙද(ර්) ඕ ටෝක් ටු ඊච් අද(ර්) . බට් ඉන් අව(ර්) ටයිම් , වී හෑඩ් ජස්ට් ඉනෆ් ෆ්‍රීඩම් ටු මේක් ෆ්‍රෙන්ඩ්ලි කන්ටැක්ට් විතවුට් ක්‍රොසිං දෝස් ඉන්විසිබල් ලයින්ස්

පිරිමි සහ ගැහැණු නේවාසිකාගාර දෙකෙහිම පාලක වරුන් තරුණ සහ මිත්‍රශීලි අය වූහ .වරක් එක් සහායකයෙකු අපට පැවසුවේ , කලින් සිටි පාලක වරුන් දැඩි නීති කාරයන් බවත් , කිසිවිටෙකත් ගැහැණු ළමුන්ට සහ පිරිමි ළමුන්ට එකට සෙල්ලම් කිරීමට හෝ එකිනෙකා සමග කතා කිරීමටවත් ඉඩ නොදුන් බවයි .නමුත් අපේ කාලයේදී , ඒ නොපෙනෙනන (නොපෙනෙන ලෙස පනවා තිබූ) සීමා මායිම් නොපැන මිත්‍රශීලි ලෙස සම්බන්ධ වීමට තරම් ප්‍රමාණවත් නිදහසක් අපට ලැබුණි (warden - වෝඩ්න් -යම් ස්ථානයක පාලකයා ) ( invisible - ඉන්විසිබල් - නොපෙනෙන)

Playtime was our favorite in our hostel life . We played cricket on the school grounds. A few students who lived nearby also joined us

ප්ලේ ටයිම් වෝස් අව(ර්) ෆේවරිට් ඉන් අව(ර්) හොස්ටල් ලයිෆ් . වී ප්ලේඩ් ක්‍රිකට් ඔන් ද ස්කූල් ග්‍රවුන්ඩ්ස් .අ ෆිව් ස්ටුඩන්ට්ස් හූ ලිව්ඩ් නියර්)බයි ඕල්සෝ ජොයින්ඩ් අස්

සෙල්ලම් කාලය නේවාසිකාගාර ජීවිතයේ අපගේ ප්‍රියතම කාලය විය . අපි පාසැල් ක්‍රීඩාංගනයේ ක්‍රිකට් සෙල්ලම් කළෙමු. අහල පහල ජිවත් වූ සිසුන් කිහිප දෙනෙක්ද අප සමග එක් වුහ

Saman was the star cricketer. Just as he excelled in his studies, he excelled in sports too. He batted beautifully, hitting huge sixes, lovely drives, and pulls.

සමන් වෝස් ද ස්ටා(ර්) ක්‍රිකට(ර්) . ජස්ට් ඈස් හී එක්සෙල්ඩ් ඉන් හිස් ස්ටඩීස් හී එක්සෙල්ඩ් ඉන් ස්පෝට්ස් ටූ . හී බැටඩ් බියුටිෆුලි , හිටිං හියුජ් සික්සස් , ලව්ලි ඩ්‍රයිව්ස් , ඇන්ඩ් පුල්ස්

ක්‍රිකට් තරුව වුයේ සමන්ය. තම ඉගෙනීම් කටයුතු වලට ඔහු විශිෂ්ට වුවා සේම ක්‍රීඩාවේදීද ඔහු විශිස්ට විය. දැවැන්ත හයේ පහරවල් , අලංකාර ඩ්‍රයිව් සහ පුල් පහරවල් එල්ල කරමින් ඔහු අලංකාර ලෙස පිත්ත හැසිරුවේය (excell - යමක විශිෂ්ටත්වයට පත් වෙනවා )

When he played a fantastic shot he boasted that he played that shot just like Vivian Richards, Javed Miandad, David Gower, or Roshan Mahanama. We didn’t know for sure and we just agreed by nodding our heads. We’d never seen most of those players in action - only pictures in newspapers and magazines

වෙන් හී ප්ලේඩ් අ ෆැන්ටෑස්ටික් ෂොට් හී බෝස්ටඩ් දැට් හී ප්ලේඩ් දැට් ෂොට් ජස්ට් ලයික් විවියන් රිච(ර්)ඩ්ස් , ජාවෙඩ් මියන්ඩෑඩ්, ඩේවිඩ් ගව(ර්) ඕ රොෂාන් මහානාම . වී ඩිඩ්න්ට් නෝ ෆෝ ෂුව(ර්) ඇන්ඩ් වී ජස්ට් ඇග්‍රීඩ් බයි නොඩිං අව(ර්) හෙඩ්ස්. වී හෑඩ් නෙව(ර්) සීන් මෝස්ට් ඔෆ් දෝස් ප්ලේය(ර්ස් ඉන් ඇක්ෂන් , ඔන්ලි පික්ච(ර්ස් ඉන් නිව්ස්පේප(ර්ස් ඇන්ඩ් මැගසින්ස් .

අලංකාර පහරක් එල්ල කල විට , තමා එම පහර එල්ල කලේ විවියන් රිච(ර්)ඩ්ස් , ජාවෙඩ් මියැන්ඩෑඩ් , ඩේවිඩ් ගව(ර්) හෝ රොෂාන් මහානාම එම පහර එල්ල කරන ආකාරයටම යැයි ඔහු පුරසාරම් කීවේය. අපි හරියටම (ඒගැන) නොදැන සිටි අතර හිස වනා ඔහු සමග එකඟ වීමු. පත්තර සහ සඟරා වල පින්තූර හැර , මේ බොහෝ ක්‍රීඩකයන් ක්‍රීඩා කරනු අප කිසිදිනෙක දැක නොතිබුණි

(fantastic - අපූරු )(boast - පුරසාරම් කියනවා )

He bought a sports magazine every week, so he knew all about these players. He even knew their hometowns, birthdays, and spouses’ names.

හී බෝට් අ ස්පෝට්ස් මැගසින් එව්රි වීක් , සෝ හී නිව් ඕල් අබවුට් දීස් ප්ලේය(ර්)ස්. හී ඊවන් නිව් දෙයා හෝම් ටවුන්ස් , බ(ර්)ත්ඩේස් ඇන්ඩ් ස්පෞසස් නේම්ස්

ඔහු සතිපතාම ක්‍රීඩා සඟරාවක් මිලට ගත්තේය . ඒ නිසා ඔහු මේ ක්‍රීඩකයන් ගැන සියලු දේ දැන සිටියේය .ඔහු ඔවුන්ගේ ගම් පළාත් , උපන් දින සහ ඔවුන්ගේ සහකාරියන්ගේ නම් පවා දැන සිටියේය (spouse - ස්පෞස් - සහකරුවා )

He spent 10 rupees on that magazine every week . We always eagerly waited until the day he brought it to school to read it.

හී ස්පෙන්ට් ටෙන් රුපීස් ඔන් දැට් මැගසින් එව්රි වීක් . වී ඕල්වේස් ඊග(ර්)ලි වේටඩ් අන්ටිල් ද ඩේ හී බ්‍රෝට් ඉට් ටු ස්කූල් ටු රීඩ් ඉට්

ඔහු ඒ සඟරාව සඳහා සෑම සතියකම රුපියල් 10ක් ක් වැය කළේය .ඔහු එය පාසලට රැගෙන එන දවස වෙන තුරු එය කියවීමට අපි නිතරම මහත් ඕනෑකමින් බලා සිටියෙමු (eagerly - ඉතා උනන්දුවෙන් )

At that time, most of our parents gave us only 5 rupees a day to buy snacks during the interval . Buying a sports magazine for 10 rupees was a dream for us. So Saman became our unofficial sports news reporter

ඇට් දැට් ටයිම් , මොස්ට් ඔෆ් අව(ර්) පේරන්ට්ස් ගේව් අස් ඔන්ලි ෆයිව් රුපීස් අ ඩේ ටු බයි ස්නැක්ස් ඩියුරින් ද ඉන්ටවල්. බයිං අ ස්පෝට්ස් මැගසින් ෆෝ ටෙන් රුපීස් වෝස් අ ඩ්‍රීම් ෆෝ අස් . සෝ සමන් බිකේම් අව(ර්) අන්ඔෆිෂල් ස්පෝට්ස් රිපෝට(ර්)

එකල , බොහෝ අපගේ දෙමව්පියන් විවේක කාලයේදී කෙටි කෑමක් ගැනීමට අපට දුන්නේ දවසකට රුපියල් 5කි. එනිසා රුපියල් 10 කට ක්‍රීඩා සඟරාවක් මිලට ගැනීම අපට නම් සිහිනයක් විය. ඒ නිසා අපගේ නිල නොවන ක්‍රීඩා පුවත් වාර්තා කරු වූයේ සමන්ය

After a game of cricket, we sometimes just sat along the short concrete brim lining one side of the playground or under the row of temple trees. We had time until six. By six, we had to be inside the hostel. Until then, we simply sat around wasting time talking , just idle talk.

ආෆ්ට(ර්) අ ගේම් ඔෆ් ක්‍රිකට්, වී සමටයිම්ස් ජස්ට් සැට් අලෝං ද ෂෝට් කොන්ක්‍රීට් බ්‍රිම් ලයිනිං වන් සයිඩ් ඔෆ් ද ප්ලේග්‍රවුන්ඩ් ඕ අන්ඩ(ර්) ද රෝ ඔෆ් ටෙම්පල් ට්‍රීස්. වී හැඩ් ටයිම් අන්ටිල් සික්ස්. බයි සික්ස්, වී හැඩ් ටු බී ඉන්සයිඩ් ද හොස්ටල්. අන්ටිල් දෙන්, වී සිම්ප්ලි සැට් අරවුන්ඩ් වේස්ටින් ටයිම් ටෝකිං , ජස්ට් අයිඩ්ල් ටෝක්.

ක්‍රිකට් ක්‍රීඩාවකට පසු , සමහර වෙලාවට අපි ක්‍රීඩා පිටියේ එක් පැත්තක් මායිම් වූ කෙටි කොන්ක්‍රීට් වැටිය දිගට හෝ අරලිය ගස් පේළිය යට හිඳ ගෙන සිටියෙමු . හය වෙනතුරු අප ට වෙලාව තිබුණි . හයට අප නේවාසිකාගාරය තුල සිටිය යුතුය . එතෙක් අපි නිකං වාඩි ගෙන වල්පල් කතා කරමින් කාලය ගෙවා දමමින් සිටියෙමු .

Most of the time, our conversations were about different situations at school involving teachers, students, and sometimes even non-academic staff. Teachers were criticized ,students were laughed at, and the workers were ridiculed , but never with any malice. Sometimes our talk drifted into international sports. Apart from cricket, we talked about tennis, football, boxing, and athletics.

මෝස්ට් ඔෆ් ද ටයිම්, අව(ර්) කන්වර්සේෂන්ස් ව(ර්) අබවුට් ඩිෆරන්ට් සිටුවේෂන්ස් ඇට් ස්කූල් ඉන්වොල්විං ටීච(ර්)ස්, ස්ටුඩන්ට්ස්, ඇන්ඩ් සම්ටයිම්ස් ඊවන් නොන්-ඇකඩමික් ස්ටාෆ්. ටීච(ර්)ස් ව(ර්) ක්‍රිටිසයිස්ඩ් ,ස්ටුඩන්ට්ස් ව(ර්) ලාෆ්ට් ඇට්, ඇන්ඩ් ද ව(ර්)ක(ර්)ස් ව(ර්) රිඩිකියුල්ඩ්, බට් නෙව(ර්) විත් එනි මැලිස්. සමටයිම්ස් අව(ර්) ටෝක් ඩ්‍රිෆ්ටඩ් ඉන්ටු ඉන්ට(ර්)නැෂනල් ස්පෝට්ස්. අපාට් ෆ්‍රොම් ක්‍රිකට්, වී ටෝක්ඩ් අබවුට් ටෙනිස්, ෆුට්බෝල්, බොක්සිං ඇන්ඩ් ඇත්ලෙටික්ස්.

බොහෝ වෙලාවට අපේ කතා බහට පාදක වුනේ  ගුරුවරු, සිසුන්, සහ සමහර වෙලාවට ගුරු නොවන සේවකයින්වද අදාළ විවිධ සිදුවීම්ය. ගුරුවරු විවේචනයට ලක් වූහ, සිසුන්  සිනාවට ලක් විය , සේවකයෝ උපහාසයට ලක්වූහ : නමුත් ඒ කිසිවක් කිසිඳු ද්වේෂයකින් නොවීය. සමහර වෙලාවට අපේ කතාබහ  ජාත්‍යන්තර ක්‍රීඩාවට යොමු විය . ක්‍රිකට් වලට අමතරව ටෙනිස්, පාපන්දු, බොක්සිං සහ මලල ක්‍රීඩා ගැනත් අපි කතා කළෙමු.

(involve - ඉන්වෝල්ව් - සම්බන්ධ වෙනවා , පැටලෙනවා ) (academic - ඇකඩමික් - අධ්‍යාපනයට සම්බන්ධ) ( non academic -නොන් ඇකඩමික් - අනධ්‍යයන) ( critisize - ක්‍රිටිසයිස් - විවේචනය කරනවා) (ridicule රිඩිකියුල් - අවඥා කරනවා , නින්දා කරනවා ) (malice - මැලිස් - ද්වේශය)

Beautiful female tennis players like Steffi Graf or Monica Seles, the brutal boxing heroics of Mike Tyson, or the incredible athletic achievements of Carl Lewis often became the center of our discussions. At other times, we talked about international events — the terrifying air attacks by American planes during the Gulf War, the latest launch of the Space Shuttle *Discovery*, or the upcoming Olympic Games.

බියුටිෆුල් ෆීමේල් ටෙනිස් ප්ලේය(ර්)ස් ලයික් ස්ටෙෆි ග්‍රාෆ් ඕ  මොනිකා සෙලෙස්, ද බෘටල් බොක්සිං හීරොයික්ස් ඔෆ් මයික් ටයිසන්, ඕ ද ඉන්ක්‍රෙඩිබල් ඇත්ලෙටික් අචීව්මන්ට්ස් ඔෆ් කාල් ලුවිස් ඔෆ්ටන් බිකේම් ද සෙන්ට(ර්) ඔෆ් අව(ර්) ඩිස්කෂන්ස්. ඇට් අද(ර්) ටයිම්ස්, වී ටෝක්ඩ් අබවුට් ඉන්ට(ර්)නැෂනල් ඉවෙන්ට්ස් — ද ටෙරිෆයිං එයා(ර්) ඇටෑක්ස් බයි අමෙරිකන් ප්ලේන්ස් ඩියුරිං ද ගල්ෆ් වෝ(ර්), ද ලේටස්ට්  ලෝන්ච් ඔෆ් ද ස්පේස් ෂටිල් “ඩිස්කවරි”, ඕ ද අප්කමිං ඔලිම්පික් ගේම්ස්.

ස්ටෙෆි ග්‍රාෆ් හෝ මොනිකා සෙලෙස් වැනි ලස්සන ටෙනිස් ක්‍රීඩිකාවන්, මයික් ටයිසන්ගේ කෲර බොක්සිං වීරකම්, කාල් ලුවිස්ගේ අපූරු මලල ක්‍රීඩා ජයග්‍රහණ බොහෝ විට අපේ කතාබහට මුල්විය . වෙනත් වෙලාවට අපි  , ගල්ෆ් යුද්ධයේදී ඇමරිකානු ගුවන් යානා කළ බිහිසුණු  ගුවන් ප්‍රහාර,  “ඩිස්කවරි”  අභ්‍යවකාශ යානයේ නවතම දියත් කිරීම, හෝ ඉදිරියට එන ඔලිම්පික් ක්‍රීඩා වැනි ජාත්‍යන්තර සිද්ධි ගැන කතා කළෙමු

(heroics - හිරොයික්ස් - වීර ක්‍රියා) ( brutal - බෲටල් - දරුණු , මෘග) ( incredible - ඉන් ක්‍රෙඩි බල් - ඇදහිය නොහැකි ) (athletic - ඇත් ලෙටික් - මලල ක්‍රීඩාවට සම්බන්ධ ) (terrifying - ටෙරි ෆයින් - බියජනක )( launch - ලෝන්ච් - දියත් කරනවා )

Out of all of us, Saman had a wealth of knowledge. He explained, elaborated, and analyzed everything almost like a sage. Sometimes, before we returned to the hostel, we gathered whatever small change we had with us. Saman always contributed the largest amount.

අවුට් ඔෆ් ඕල් ඔෆ් අස්, සමන් හැඩ් අ වෙල්ත් ඔෆ් නෝලෙජ්. හී එක්ස්ප්ලේන්ඩ්, ඉලැබරේටඩ්, ඇන්ඩ් ඇනලයිස්ඩ් එව්රිතිං ඕල්මෝස්ට් ලයික් අ සේජ්. සම්ටයිම්ස්, බිෆෝ  වී රිට(ර්)න්ඩ් ටු ද හොස්ටල්, වී ගැද(ර්ඩ් වට්එව(ර්) ස්මෝල් චේන්ජ් වී හෑඩ් විත් අස්. සමන් ඕල්වේස් කන්ට්‍රිබියුටඩ්  ද ලාජස්ට් අමවුන්ට්.

අප සියල්ලන්ම අතරින් සමන්ට අති විශාල දැනුමක් තිබුණි . ඔහු  හැම දෙයක්ම විස්තර කලේ , පැහැදිලි කලේ සහ  විශ්ලේෂණය කලේ මහා ප්‍රඥයෙකු මෙනි. ඇතැම් විටෙක  අපි නේවාසිකාගාරයට ආපසු යාමට පෙර , අප ළඟ තිබූ කුමන හෝ කුඩා මුදල් ප්‍රමාණයන් එකතු කළෙමු . එහිදීද නිතරම වැඩිම මුදල දැම්මේ සමන්ය

(elaborate - ඉලැබරේට් - විස්තර කරනවා) ( analyze - ඇනලයිස් - විශ්ලේෂණය කරනවා) ( sage - සේජ් - පඬි වරයා)( gather- ගැද(ර්) - එකතු කරනවා) ( contribute - කන්ට්‍රිබියුට් - දායක වෙනවා)

Then he would quietly slip through the barbed-wire fence along the school boundary and go to a nearby shop to buy fruit ice cubes even though it was totally prohibited to go out

දෙන් හී වුඩ් ක්වයට්ලි ස්ලිප් ත්රූ ද බාබ්ඩ්-වය(ර්) ෆෙන්ස් අලෝං ද ස්කූල් බවුන්ඩරි ඇන්ඩ් ගෝ ටු අ නියර්බයි ෂොප් ටු බයි ෆෘට් අයිස් කියුබ්ස් ඊවන් දෝ ඉට් වෝස් ටෝටලි ප්‍රොහිබිටඩ් ටු ගෝ අවුට්

අනතුරුව ඔහු පාසල් සීමාව දිගේ තිබුණ කම්බි වැට හරහා හෙමින් සැරේ හොරෙන් රිංගා , එලියට යාම අපට සම්පූර්ණයෙන්ම තහනම් වුවත්, අසල කඩයකට ගොස් පලතුරු අයිස් කැට මිලට ගනු ඇත

Those ice cubes, with tiny pieces of fruit inside, were extremely popular among us in those days. If we didn't have enough money, Saman would add whatever was needed from his own pocket. His parents always gave him enough money. Most of our parents did not give us that much money. However those afternoons were filled with stories, laughter, and dreams a lot bigger than our pocket money.

දෝස් අයිස් කියුබ්ස්, විත් ටයිනි පීසස් ඔෆ් ෆෘට් ඉන්සයිඩ්, ව(ර්) එක්ස්ට්‍රීම්ලි පොපියුල(ර්) අමං අස් දෝස් ඩේස්. ඉෆ් වී ඩිඩ්න්ට් හැව් ඉනෆ් මනී, සමන් වුඩ් ඇඩ් වට්එව(ර්) වෝස් නීඩඩ් ෆ්‍රොම් හිස් ඕන් පොකට්. හිස් පේරන්ට්ස් ඕල්වේස් ගේව් හිම් ඉනෆ් මනී. මෝස්ට් ඔෆ් අව(ර්) පේරන්ට්ස් ඩිඩ් නොට් ගිව් අස්(ගිවස්) දැට් මච් මනී. හව්එව(ර්) දෝස් ආෆ්ට(ර්)නූන්ස් ව(ර්) ෆිල්ඩ් විත් ස්ටෝරීස් , ලාෆ්ට(ර්) ඇන්ඩ් ඩ්‍රීම්ස් අ ලොට් බිග(ර්) දෑන් අව(ර්) පොකට් මනී

ඇතුළේ පොඩි පලතුරු කැබලි තිබුණ ඒ අයිස් කැට ඒ දිනවල අප අතර ඉතා ජනප්‍රියය . අපිට මුදල් මදි වුවහොත් , අවශ්‍ය කුමන හෝ මුදලක් සමන් තම සාක්කුවෙන් දමනු ඇත. ඔහුගේ දෙමව්පියන් ඔහුට හැමවිටම ප්‍රමාණවත් මුදල් දුන්නහ . අප බොහෝ දෙනෙකුගේ දෙමව්පියන් අපට එපමණ මුදල් දුන්නේ නැත. කෙසේ වුවත් ඒ සන්ධ්‍යාවන් , කතන්දර , සිනහවන් සහ අපගේ පොකට් මනි වලට වඩා බෙහෙවින් විශාල වූ සිහිනයන්ගෙන් පිරී තිබුණි

**Language Focus**

- ඉහත කෙටි කතාවේ ආපු මෙන්න මේ වාක්‍යය බලන්න . ඒ වාක්‍යයයේ වැදගත් දෙයක් තියෙනවා දැනගන්න

So, buying a sports magazine for 10 rupees was a dream for us.
සෝ , බයිං අ ස්පෝට්ස් මැගසින් ෆෝ ටෙන් රුපීස් වෝස් අ ඩ්‍රීම් ෆෝ අස්
එනිසා රුපියල් 10 කට ක්‍රීඩා සඟරාවක් මිලට ගැනීම අපට නම් සිහිනයක් විය

- ක්‍රියාපදයකට ing එකතු වුනාම එහි ing රූපය , ඒ කියන්නේ ඒ ක්‍රියාව කරමින් ඉන්නවා කියන තේරුම ලැබෙනවා . ඊට අමතරව සමහර අවස්ථා වලදී ක්‍රියාපදයක ing රූපය , ඒ ක්‍රියාව “කිරීම” යන අර්ථයෙන් යෙදෙනවා , ඒ කියන්නේ මෙන්න මේ වගේ

buying - මිලට ගැනීම

helping - උදව් කිරීම

travelling - සංචාරය කිරිම

watching - නැරඹීම

playing - සෙල්ලම් කිරීම

sleeping - නිදා ගැනීම

- මෙසේ යෙදුනාම එය ක්‍රියා පදයක් නෙවෙයි ඇත්තටම, එවිට එය නාම පදයක්

Buying a new house in Colombo will not be easy
බයිං අ නිව් හවුස් ඉන් කලම්බු විල් නොට් බී ඊසි
කොළඹින් ගෙයක් ගැනීම ලේසි නැහැ

Travelling alone in that area is not advisable
ට්‍රැවලිං අලෝන් ඉන් දැට් ඒරියා ඉස් නොට් ඇඩ්වයිසබල්
ඒ පළාතේ තනියම සංචාරය කිරීම නුවනට හුරු නැහැ

Watching tv is my favourite hobby
වොචිං ටීවී ඉස් මයි ෆේවරිට් හොබී
ටීවී බැලීම මගේ ප්‍රියතම විනෝදාංශය

Sleeping in day time is not good for health
ස්ලීපිං ඉන් ඩේ ටයිම් ඉස් නොට් ගුඩ් ෆෝ හෙල්ත්
දවල් නිදා ගැනීම සෞඛ්‍යයට හොඳ නැහැ

Cooking at home saves money.
කුකිං ඇට් හෝම් සේව්ස් මනී
ගෙදර ඉවීම සල්ලි ඉතුරු කරනවා

Driving at night can be dangerous
ඩ්‍රයිවිං ඇට් නයිට් කැන් බී ඩේන්ජරස් .
රෑ වාහන එලවීම අනතුරු දායක විය හැකියි

- හොදයි , ඊළගට මේ වාක්‍යය අරගෙන බලමු

He even knew their hometowns, birthdays, and spouses' names

හී ඊවන් නිව් දෙයා(ර්) හෝම් ටවුන්ස් , බ(ර්)ත්ඩේස් ඇන්ඩ් ස්පෞසස් නේම්ස්

ඔහු ඔවුන්ගේ ගම් පළාත් , උපන් දින සහ ඔවුන්ගේ සහකාරියන්ගේ නම් පවා දැන සිටියේය

- මෙහි ක්‍රියා පදයට ඉදිරියෙන් even -ඊවන් යෙදුනාම , ඒ ක්‍රියාව පවා ඔහු කළා / එයත් කළා කියන අදහස එනවා .මේ තවත් එවැනි වාක්‍යය කීපයක්

She even remembered my name

ෂී ඊවන් රිමෙම්බ(ඊ)ඩ් මයි නේම්

ඇයට මගේ නම පවා මතක තිබුනා .

He even gave us his vehicle

හී ඊවන් ගේව් අස් හිස් වෙහිකල්

ඔහු අපිට ඔහුගේ කාරෙක පවා දුන්නා

.

I even called him twice, but he didn't answer.

අයි ඊවන් කෝල්ඩ් හිම් ට්වයිස් , බට් හී ඩිඩ්න්ට් ආන්ස(ඊ)

මම ඔහුට දෙපාරක්ම කතාත් කළා , නමුත් ඔහු පිළිතුරු දුන්නේ නැහැ

I even waited 2 hours for her

අයි ඊවන් වේටඩ් ටූ අව(ඊ)ස් ෆෝ හ(ඊ)

මම ඇය එනකල් පැය දෙකක් බලාගෙනත් හිටියා

I even went to his home to meet him

අයි ඊවන් වෙන්ට් ටු හිස් හවුස් ටු මීට් හිම්

මම ඔහුව හමුවෙන්න ඔහුගේ ගෙදරටත් ගියා

She even cooked a meal for me

ෂී ඊවන් කුක්ඩ් අ මීල් ෆෝ මී

ඇය මට කෑම වේලක් උයලත් දුන්නා

- අපට මේ වාක්‍යයත් හමුවුනා ඉහත කෙටි කතාවේ අග භාගයේ

It was totally prohibited go out .

ඉට් වෝස් ටෝටලි ප්‍රොහිබිටඩ් ටු ගෝ අවුට්

සම්පූර්ණයෙන්ම තහනම් වුනා එලියට යන්න

ඒ රටාවට හැදුනු මේ වාක්‍ය දෙස බලමු

It is totally prohibited to smoke inside the building.
ඉට් ඉස් ටෝටලි ප්‍රොහිබිටඩ් ටු ස්මෝක් ඉන්සයිඩ් ද බිල්ඩිං.
ගොඩනැගිල්ල ඇතුළත දුම්පානය කිරීම සම්පූර්ණයෙන්ම තහනම්.

It was totally prohibited to use smartphones inside the classrooms.
ඉට් වෝස් ටෝටලි ප්‍රොහිබිටඩ් ටු යූස් ස්මාට්ෆෝන්ස් ඉන්සයිඩ් ද ක්ලාස්රූම්ස්.
පන්ති කාමර තුළ ස්මාර්ට්ෆෝන් භාවිතා කිරීම සම්පූර්ණයෙන්ම තහනම් වුනා

It was strictly banned to stay after 6 p.m.
ඉට් වෝස් ස්ට්‍රික්ට්ලි බෑන්ඩ් ටු ස්ටේ ආෆ්ට(ර්) සික්ස් පී.එම්.
සවස 6ට පසු රැඳී සිටීම දැඩි ලෙස තහනම් විය.

It is restricted to log onto social media through school computers.
ඉට්ස් රිස්ට්‍රික්ටඩ් ටු ලොග් ඔන්ටු සෝෂල් මීඩියා ත්‍රෲ ස්කූල් කම්පියුට(ර්)ස්
පාසල් පරිගණක හරහා සමාජ මාධ්‍ය වෙත ප්‍රවේශ වීම සීමා කර ඇත. ( restrict - රිස්ට්‍රික්ට් - සීමා කරනවා )

It was forbidden to enter the area without prior approval.
ඉට් වෝස් ෆොබිඩ්න් ටු එන්ට(ර්) ද ඒරියා විතවුට් ප්‍රය(ර්) ඇප්‍රෲවල්.
පෙර අනුමැතියකින් තොරව එම ප්‍රදේශයට ඇතුළු වීම තහනම් විය ( forbid - ෆොබිඩ් - තහනම් කරනවා )

- හොදයි , ඉහත අපට හමුවුණු මේ වාක්‍යයත් මතක තබා ගැනීමට ඉතාම හොඳ වාක්‍යය

That’s a long way from here.

දැට්ස් අ ලෝං වේ ෆ්‍රොම් හියර්)

මෙහෙ ඉදන් සෑහෙන්න දුර

Do you travel from there daily?

ඩූ යූ ට්‍රැවල් ෆ්‍රොම් දෙයා ඩේලි ?

ඔයා දිනපතා එහෙ ඉදන් එනවද ?

Horawala is also quite far from here.

හොරවල ඉස් ඕල්සෝ ක්වයිට් ෆා ෆ්‍රොම් හියර්).

හොරවලත් මෙහෙ ඉදන් සෑහෙන්න දුරයි

hostel - හොස්ටල් - නේවාසිකාගාරය

daily - ඩේලි - දිනපතා

Buses are rare on that route

බසස් ආ රෙයා ඔන් දැට් රූට්

බස් අඩුයි ඒ පාරේ

He said with a grin

හී සේඩ් විත් අ ග්‍රින්

සිනාවක් සමග ඔහු කීවේය

Who should I speak to ?

හූ ෂුඩ් අයි ස්පීක් ටු ?

මම කාටද කතා කරන්න ඕන ?

It was clean and tidy.

ඉට් වෝස් ක්ලීන් ඇන්ඩ් ටයිඩි

එය පිරිසිදුව සහ පිළිවෙලට තිබුණි.

We acted like we didn’t know each other

වී ඇක්ටඩ් ලයික් වී ඩිඩ්න්ට් නෝ ඊච් අද(ර් )

අපි හැසිරුණේ අපි එකිනෙකා නොදන්නව වගේ

We didn’t know for sure

වී ඩිඩ්න්ට් නෝ ෆෝ ෂුව(ර්)

අපි හරියටම දැනන් හිටියේ නැහැ

**Vocabulary 61**

hostel - හොස්ටල් - නේවාසිකාගාරය

daily - ඩේලි - දිනපතා

route - රූට් - මාර්ගය

regular - රෙගියුල(ර්) - අඛණ්ඩ , විදිමත්

rare - රෙයා - දුලබ , නිතර නැති , හැමතැනම නැති

warden - වෝඩ්න් - යම් ස්ථානයක පාලකයා, පාසලක හෝ එහි කොටසක ප්‍රධානියා

lined up - ලයින්ඩ් අප් - පෙළ ගැසුණු

store - ස්ටෝ - ගබඩා කරනවා , ගබඩාව

storeroom - ස්ටෝ රූම් - ගබඩා කාමරය

patch - පැච් - තීරුව

primary ප්‍රයිමරි - ප්‍රථමික , මූලික

primary section - ප්‍රයිමරි සෙක්ෂන් - ප්‍රාථමික අංශය

occasionally - ඔකේෂනලි - ඉඳල හිටලා

act - ඇක්ට් - හැසිරෙනවා , ක්‍රියා කරනවා

golden - ගෝල්ඩන් - රන්වන්

skin - ස්කින් - සම

playtime - ප්ලේටයිම් - සෙල්ලම් කරන කාලය

star - ස්ටා - තරුව

huge - හියුජ් - විශාල

hit - හිට් - ගහනවා

lovely - ලව්ලි - අලංකාර , ලස්සන

fantastic - ෆැන්ටෑස්ටික් - අපූරු , අගේ ඇති

boast - බෝස්ට් - පුරසාරම් දොඩනවා , පුරාජේරු කියනවා

magazine - මැගසීන් - සඟරාව

hometown - හෝම්ටවුන් - ගම් පළාත

spouse - ස්පවුස් - සහකරු හෝ සහකාරිය

eagerly - ඊග(ර්)ලි - මහත් ඕනෑකමින්

Concrete – කොන්ක්‍රීට් – කොන්ක්‍රීට්

Brim – බ්‍රිම් – ගැට්ට

Line – ලයින් – රේඛාව , පෙළ , රේඛාවකින් ලකුණු කරනවා

Idle talk – අයිඩල් ටෝක් – නිකම් කතා , වල්පල්

Conversation – කන්ව(ර්)සේෂන් – කතාබහ

Involving – ඉන්වෝල්විං – සම්බන්ධව …

Academic – ඇකඩමික් – අධ්‍යාපනික

Non-academic – නොන් ඇකඩමික් – අධ්‍යාපනික නොවන

Criticize – ක්‍රිටිසයිස් – විවේචනය කරනවා

Laugh – ලාෆ් – සිනාසෙනවා

Ridicule – රිඩිකියුල් – සමච්චල් කරනවා, උපහාසයට ලක් කරනවා

Malice – මැලිස් – ද්වේෂය

Drift – ඩ්‍රිෆ්ට් – පාවී යනවා , යොමු වෙනවා ,හෙමින් වෙනත් දෙයකට හැරෙනවා

International – ඉන්ට(ර්)නැෂනල් – ජාත්‍යන්තර

Athletics – ඇත්ලෙටික්ස් – මලල  ක්‍රීඩා

Brutal – බෘටල් – කෘර , අමානුෂික

Heroics – හිරොයික්ස් – වීර ක්‍රියා

Incredible – ඉන්ක්‍රෙඩිබල් –  විශ්වාස කරන්න බැරි , සුවිශේෂ

Achievement – අචීව්මන්ට් – ජයග්‍රහණය

Terrifying – ටෙරිෆයිං – භයානක

Launch – ලෝන්ච් – දියත් කරනවා

Space – ස්පේස් – අභ්‍යවකාශය , ඉඩ

Spacecraft – ස්පේස්ක්‍රාෆ්ට් – අභ්‍යවකාශ යානය

Upcoming – අප්කමිං – ඉදිරියේදී පැමිණෙන

Wealth – වෙල්ත් –  ධනය

Knowledge – නෝලෙජ් – දැනුම

Explain – එක්ස්ප්ලේන් – පැහැදිලි කරනවා

Elaborate – එලැබරේට් – විස්තර වශයෙන් පැහැදිලි කරනවා

Analyze – ඇනලයිස් – විශ්ලේෂණය කරනවා

Gather – ගැද(ර්) – එකතු කරනවා , එකතු වෙනවා

Change – චේන්ජ් – මාරු  සල්ලි

Contribute – කන්ට්‍රිබියුට් – දායක වෙනවා

Amount – අමවුන්ට් – ප්‍රමාණය

Large – ලාජ් – විශාල

Larger – ලාජ(ර්) – තවත් විශාල

Largest – ලාජස්ට් – ඉතාම විශාල

Quietly – ක්වයට්ලි – හෙමින් සැරේ , නිහඬව

Barbed-wire – බාබ්ඩ්-වය(ර්) – කටු කම්බිය

Fence – ෆෙන්ස් – වැට

Boundary – බවුන්ඩරි – සීමාව

Nearby – නියර්)බයි – අසල

Prohibit – ප්‍රොහිබිට් – තහනම් කරනවා

Piece – පීස් – කැබැල්ල

Peace – පීස් – සාමය

Extremely – එක්ස්ට්‍රීම්ලි – අතිශයින්

Fill – ෆිල් – පුරවනවා

Filled with ….. – ෆිල්ඩ් විත් ….. – (වලින් ) පිරී තිබෙන

Laughter – ලාෆ්ට(ර්) – සිනාව

Pocket money – පොකට් මනී – සුළු වියදම් සඳහා දෙන මුදල්

dream - ඩ්‍රීම් - සිහිනය , සිහින දකිනවා